8 වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ තෝරා ගත් කර්මාන්ත කීපයක ගතිලක්ෂණ

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික රටක් වුව ද 1950න් පසුව කර්මාන්ත ක්ෂේත්‍රය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදි. 1960 දශකයේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කර්මාන්ත ඇරඹීම වර්ධනය වූ අතර 1970-77 කාලයේ රාජ්‍ය ප්‍රාග්ධන සහභාගිත්වය ඉහළ ගියේ ය. 1977න් පසුව පෞද්ගලික අංශයේ කර්මාන්ත සංවර්ධනයට ප්‍රමුඛ ස්ථානයක් ලැබීම නිසා දේශීය ආර්ථිකයෙහි කර්මාන්ත අංශයට විශේෂ තැනක් හිමි විය. මෙයට නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය හේතු විය.

## ශ්‍රී ලංකා ආර්ථිකයේ කර්මාන්තවල වැදගත්කම

- දළ දේශීය නිෂ්පාදිතය තුළ කර්මාන්ත අංශයේ දායකත්වය ඉහළ යාම.
  2010 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත අංශයෙහි දායකත්වය 28.7%කි.
  (මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, 2010)
- කාර්මික අපනයනයන්ගෙන් විශාල විදේශ විනිමයක් උපයා දීම.
  2010 කාර්මික අපනයන ඉපැයීම්වල දායකත්වය මුළු අපනයන ඉපයීම්වලින් 74.3%කි.
  (මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, 2010)
- සේවා නියුක්තියට (රැකියා සම්පාදනය) දායක වීම.
  2010 මුළු සේවා නියුක්තියෙන් 24.2%ක් කර්මාන්ත අංශයට හිමි වේ. (මූලාශ්‍රය: 2010 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව)
- ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම.
  නගරයෙන් දුර බැහැර ප්‍රදේශවල කර්මාන්ත ආරම්භ වන විට ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු වීම නිසා ප්‍රාදේශීය සංවර්ධනය ඇති වීම.
- දේශීය සම්පත්වලට වැඩි වටිනාකමක් ලැබීම.
  ස්වාභාවික සම්පත්වලින් නව කර්මාන්ත නිපදවීමට සොයා බැලීම.
- විදේශීය ආයෝජනයන්ට මෙරට කර්මාන්ත ඇරඹීමට ඉඩකඩ ලැබීම නිසා ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියක් ලැබීම. (නිදහස් වෙළෙඳ කලාප, කාර්මික උද්‍යාන, කර්මාන්ත පුර)

## ශ්‍රී ලංකාවේ කර්මාන්තවල ව්‍යාප්ති රටාව


ශ්‍රී ලංකාවේ කර්මාන්ත ස්ථානගත වීමට ප්‍රධාන සාධක කීපයක් බලපා ඇත. අමුද්‍රව්‍ය, ශ්‍රමය, විදුලිය, ජලය, ප්‍රවාහන පහසුව හා වෙළෙඳපොළ, අවවුහාත්මක සාධක (යටිතල පහසුකම්) ඉන් වැදගත් ඒවා ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ කර්මාන්තවලින් වැඩි කොටසක් බස්නාහිර පළාත තුළ සංකේන්ද්‍රණය වීමක් දක්නට ලැබේ.

### කර්මාන්ත ව්‍යාප්තියේ ස්වභාවය

- නිෂ්පාදන කර්මාන්තවලින් වැඩි කොටසක් බස්නාහිර පළාත තුළ සංකේන්ද්‍රණය වීම.
- කර්මාන්ත ප්‍රාදේශීයකරණ වැඩපිළිවෙළ යටතේ කොළඹින් දුර බැහැර ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කොට කම්හල් ඇරඹීම.
- කාර්මික උද්‍යාන වැඩපිළිවෙළ යටතේ හඳුනා ගත් ප්‍රදේශවල කාර්මික උද්‍යාන ඇරඹීම.
- ප්‍රාදේශීය කාර්මික ජනපද පිහිටුවීම.
  හෝමාගම, මිනුවන්ගොඩ, කරන්දෙනිය, පන්නල, මාවතගම, පල්ලෙකැලේ ආදී ස්ථානවල කම්හල් ඇරඹීම.
- ඇගලුම් කම්හල් 200 වැඩපිළිවෙළ යටතේ බොහෝ දිස්ත්‍රික්කවල කම්හල් ඇරඹීම.
- දක්ෂිණ ලංකා සංවර්ධන ව්‍යාපෘතිය සහ ප්‍රාදේශීය කාර්මික ජනපද වැඩසටහන යටතේ කම්හල් ඇරඹීම.
- කර්මාන්ත ස්ථානගත කිරීමට රාජ්‍ය ප්‍රතිපත්තිවල බලපෑම.

## ශ්‍රී ලංකාවේ කර්මාන්ත වර්ග

ශ්‍රී ලංකාවේ කර්මාන්ත විවිධාකාරයෙන් වර්ගීකරණයට භාජනය කොට ඇත. මෙහි දැක්වෙන්නේ ඉන් එක් ක්‍රමයකි. එක් එක් කර්මාන්ත වර්ගය සඳහා උදාහරණ කීපයක් පමණක් දක්වා ඇත. තවත් නිදසුන් රාශියක් ඔබට සොයා ගත හැකි ය. (8.1 සිතියම බලන්න)




8.1 සිතියම

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කර්මාන්ත ව්‍යාප්තිය

කර්මාන්ත

- අමුද්‍රව්‍ය පදනම් කර ගත් කර්මාන්ත
  - කෘෂිපාදක කර්මාන්ත
    - තේ/හරිත තේ
    - රබර්/ටයර් ටියුබ්
    - පොල්/පොල්තෙල්
    - උක්/හකුරු
    - වී/සහල් පිටි
  - ආකර හා පතල් කැනීම්
    - මිනිරන්/පැන්සල්
    - මැණික්/ස්වර්ණාභරණ
    - පොස්පේට්/පොහොර
    - තලාතු මිනිරන්/විදුලිත් පරිවාරක
  - ඛනිජ පාදක කර්මාන්ත
    - ඛනිජවැලි/ඉල්මනයිට්
    - සිලිකා/විදුරු
    - පෙල්ස්පාර්/මාබල්/පිගන්
    - ඇපටයිට්/පොහොර මිශ්‍රණ
    - හුණුගල්/සිමෙන්ති
- අපනයනයට යොමු වූ කර්මාන්ත
  - ඇගලුම්
  - සෙල්ලම් බඩු
  - ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ
  - ආහාර නිෂ්පාදන (යුෂ හා එළවළු)
  - සම්භාණ්ඩ ආදී
- සේවා කර්මාන්ත
  - සංචාරක
  - ප්‍රවාහන
  - සන්නිවේදන
  - වෙළෙඳාම


## කෘෂිපාදක කර්මාන්ත

කර්මාන්තයට අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය කෘෂි නිෂ්පාදනයක් ආශ්‍රයෙන් ලබා ගෙන කරන කර්මාන්ත කෘෂිපාදක කර්මාන්ත ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ කෘෂිපාදක කර්මාන්ත රාශියක් ඇත. සහල් පිටි, හරිත තේ, ටයර්, ටියුබ්, පොල්තෙල්, සීනි, සෝයා මීට්, ආදිය ඊට නිදසුන් ය.

කෘෂිපාදක කර්මාන්ත කිපයක් පිළිබඳ ව සරල විස්තරයක් පහත දැක්වේ. ඒ ආකාරයට ශ්‍රී ලංකාවේ ඇති වෙනත් කෘෂි පාදක කර්මාන්ත ගැන ඔබේ අවධානය යොමු කර දැනුම අවබෝධය වර්ධනය කර ගන්න. (8.1 වගුව)

8.1 වගුව
කෘෂිපාදක කර්මාන්ත

| අදාළ කෘෂි බෝගය | නිෂ්පාදිත ද්‍රව්‍ය | නිෂ්පාදන ද්‍රව්‍ය කිපයක පින්තූර | කර්මාන්ත ස්ථානගත වූ ප්‍රදේශ |
|---|---|---|---|
| තේ | කළු තේ<br>ක්ෂණික තේ<br>හරිත තේ<br>රස කළ තේ |   | මහනුවර, බදුල්ල, රත්නපුර, නුවරඑළිය, මාතලේ, ගාල්ල, මාතර, කළුතර දිස්ත්‍රික්කය |
| රබර් | ටයර් ටියුබ්<br>සෙල්ලම් බඩු<br>ෂීට් රබර්<br>ක්‍රේප් රබර්<br>කුට්ටි රබර්<br>අත් මේස්<br>ක්‍රීඩා උපකරණ ආදිය. |    | කෑගල්ල, රත්නපුර, කළුතර, ගාල්ල කොළඹ දිස්ත්‍රික්කවලට අමතර ව සීතාවක, පල්ලෙකැලේ කර්මාන්තපුර. |

| | | | |
|---|---|---|---|
| පොල් | කපාපු පොල්<br>පොල් තෙල්<br>විනාකිරි<br>කොප්පරා<br>පිටි කළ පොල් කිරි<br>පොල් ක්‍රීම් (අපනයනයට)<br>කොහු කෙඳි<br>ලණු, කඹ, පාපිසි<br>පුන්නක්කු ආදිය |         | කොළඹ, කුරුණෑගල, හලාවත පොල් ත්‍රිකෝණය, වෙරළබඩ පොල් වගා තීරයේ |
| උක් | උක් සීනි<br>මද්‍යසාර<br>හකුරු<br>උක් රොඩු මගින් කඩදාසි |    | පැලවත්ත, හිඟුරාන, ඇඹිලිපිටිය, වාලච්චේන |
| වී | සහල් සැකසීම<br>සහල් පිටි<br>නූඩ්ල්ස් නිෂ්පාදනය<br>ක්ෂණික ආහාර<br>පිදුරු මගින් කඩදාසි |      | ඇඹිලිපිටිය, කුරුණෑගල හා මහියංගනය, වාලච්චේන, පොළොන්නරුව, හිඟුරක්ගොඩ, අනුරාධපුරය, හම්බන්තොට මහා පරිමාණයේ වී වගා ප්‍රදේශවල සහල් සැකසීම කෙරේ. |

ක්‍රියාකාරකම 1

- ❖ අංක 8.1 දරන වගු සටහනෙහි දැක්වෙන කෘෂිපාදක කර්මාන්ත හැර වෙනත් කෘෂිපාදක කර්මාන්ත පිළිබඳ තොරතුරු සොයා වගුගත කරන්න.
- ❖ ඔබ ජීවත් වන ප්‍රදේශයේ කෘෂිපාදක කර්මාන්තයක් තෝරා ගෙන, ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් පිළියෙල කොට ඔබගේ ක්ෂේත්‍ර පොතට ඇතුළත් කරන්න.

8.2 වගුව
ආකර හා පතල් කැනීම ආශ්‍රිත කර්මාන්ත

| ඛනිජ වර්ගය සහ ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ | නිෂ්පාදිත ද්‍රව්‍ය | නිෂ්පාදන ද්‍රව්‍ය කීපයක පින්තූර | කර්මාන්තය ස්ථානගත වී ඇති ප්‍රදේශ |
|---|---|---|---|
| **මිනිරන්**<br>කොලොංගහ,<br>බෝගල, කහටගහ<br>පතල් ආශ්‍රිත ව | පොලිෂ්, පැන්සල්, තීන්ත වර්ග සඳහා<br>වියළි කෝෂවල අමතර කොටස් |  | ආයෝජන ප්‍රවර්ධන කලාපවල- ඒකල, සීතාවක |
| **තලාතු මිනිරන් (මයිකා)**<br>මධ්‍යම හා සබරගමු පළාත්වල,<br>පල්ලෙකැලේ,<br>තලාතුඔය, බදුල්ල,<br>තලාගොඩ | විදුලිත් පරිවාරක ලෙස යෙදීම, රබර් කර්මාන්තයට හා තීන්ත සැකසීමේ දී භාවිත කිරීම, |  | පල්ලෙකැලේ, ඒකල, සීතාවකපුර කාර්මික ප්‍රදේශවල |
| **මැණික්**<br>රත්නපුරය, ඇලහැර,<br>ඔක්කම්පිටිය,<br>කහවත්ත, හසලක | ස්වර්ණාභරණ නිෂ්පාදනයේ දී යොදා ගනී.<br>ඔප මට්ටම් කළ මැණික් සැකසීම. |  | ආයෝජන කලාප ආශ්‍රිත ව කර්මාන්ත පිහිටා ඇත.<br>මැණික් ව්‍යාප්ත වී ඇති කලාපවල ද කර්මාන්තය පවතී. |


ක්‍රියාකාරකම 2

ශ්‍රී ලංකා ආකෘති සිතියමක,

- ❖ මැණික් ලැබෙන කලාප තුනක් ද තලාතු මිනිරන් ලැබෙන තලාතුඔය, බදුල්ල, මස්කෙළිය යන නගර තුන ද ලකුණු කර නම් කරන්න.
- ❖ මැණික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.
- ❖ ආකර හා පතල් කර්මාන්තය ආශ්‍රිත ගැටලු පහක් කෙටියෙන් දක්වන්න.
- ❖ මැණික් කර්මාන්තය නගා සිටුවීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දී ඇති ආකාරය කරුණු හතරක් මගින් දක්වන්න.

ඛනිජ පාදක කර්මාන්ත


8.3 වගුව

| ඛනිජය සහ ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ | නිෂ්පාදිත ද්‍රව්‍ය | නිෂ්පාදන ද්‍රව්‍ය කිපයක පිංතූර | කර්මාන්තය ස්ථානගත වී ඇති ප්‍රදේශ |
|---|---|---|---|
| **මයෝසීන හුණුගල්**<br>පුත්තලම සිට මුලතිව් දක්වා ශ්‍රී ලංකාවේ වයඹ හා උතුරු ප්‍රදේශය<br><br>**ස්ඵටික හුණුගල්**<br>මධ්‍ය කඳුකරයේ සිට ඊසාන දිශාගත ව | සිමෙන්ති<br><br>හුණු නිෂ්පාදනය<br>විසිතුරු භාණ්ඩ<br>ඩොලමයිට් (පොහොර සඳහා) |  | පුත්තලම, කන්කසන්තුරේ, ගාල්ල<br><br>ඛනිජ නිධි ආශ්‍රිත ප්‍රදේශවල, මාතලේ, දිගන, අනුරාධපුරය, කැලණිය |
| **සිලිකා වැලි**<br>මාරවිල, නාත්තන්ඩිය | විදුලිත් නිෂ්පාදනවල කොටස්<br>වීදුරු ආශ්‍රිත නිෂ්පාදන වර්ග<br>පරිගණක උපාංග වර්ග (සිලිකන් චිප්) |   | මාරවිල, නාත්තන්ඩිය |
| **කෙඔලින්**<br>බොරලැස්ගමුව, රත්තොට, පිලියන්දල | පිඟන් භාණ්ඩ,<br>සනීපාරක්ෂක උපකරණ,<br>විසිතුරු භාණ්ඩ, පිඟන් ගඩොල් |  | රත්තොට, මීගමුව, දංකොටුව |
| **ඛනිජවැලි**<br>ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන්, මොනසයිට්, ගානට් පුල්මුඩේ වෙරළ, කයිකාවල, බේරුවල, දෙවුන්දර | ගෙබිම ආවරණ, තීන්ත සඳහා, එනැමල් වර්ග, ගුවන් යානා සැකසීමේ දී අවශ්‍ය ද්‍රව්‍ය සැකසීම |  | කාර්මික කලාප හා කාර්මික උද්‍යාන ආශ්‍රිත ව සිදු කෙරේ. පරන්තන් රසායනික කම්හල |

## අපනයනයට යොමු වූ කර්මාන්ත

අපනයනයට යොමු වූ කර්මාන්ත මඟින් අපනයන භාණ්ඩ තුන් දහසක් පමණ රටවල් 175කට අධික ප්‍රමාණයකට නිර්යාත කෙරේ. මේවා වර්ග දෙකකට බෙදිය හැකි ය.

1. සාම්ප්‍රදායික භාණ්ඩ හෙවත් ප්‍රාථමික වශයෙන් (සකස් නො කළ) අපනයන කරන භාණ්ඩ
   (අ) විසිතුරු පැකට්වල ඇසිරූ තේ (ආ) රූටයිල් සහ ඉල්මනයිට්
2. නිෂ්පාදන භාණ්ඩ
   - ඇඟළුම්
   - සෙල්ලම්බඩු
   - මැණික් හා ආභරණ
   - ලුහු ඉංජිනේරු කර්මාන්ත
   - ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ
   - විදුලි නිෂ්පාදන එකලස් කිරීම
   - රබර් භාණ්ඩ
   - ආහාර නිෂ්පාදන (පලතුරු යුෂ හා එළවළු සැකසුම්)
   - සම්පදම් කිරීම ආදී




8.2 සිතියම
ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් ව්‍යාප්තිය

## අපනයන සඳහා ඇගළුම් නිෂ්පාදන

1. කටුනායක අපනයන සැකසුම් කලාපය - 1978
2. බියගම අපනයන සැකසුම් කලාපය - 1986
3. කොග්ගල අපනයන සැකසුම් කලාපය - 1991 යන ප්‍රධාන අපනයන සැකසුම් කලාප තුන මඟින් විශාල වශයෙන් ඇගළුම් නිෂ්පාදනය කර විදේශවලට අලෙවි කෙරේ. විදේශීය ආයෝජන මේවායේ ක්‍රියාත්මක වේ.

## කාර්මික උද්‍යාන

දුෂ්කර පළාත්වල පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීමේ ගැටලු ව මග හැරවීම සඳහා රජය විසින් කාර්මික උද්‍යාන ආරම්භ කරන ලදි. කාර්මික උද්‍යානයක දේශීය ආයෝජකයින්ට හා විදේශීය ආයෝජකයින්ට කර්මාන්ත ඇරඹීමට ඉඩ සලසා ඇත. දැනට ආරම්භ කොට ඇති කාර්මික උද්‍යාන කිපයකි. උදා:-

- ♦ පල්ලෙකැලේ කාර්මික උද්‍යානය
- ♦ සීතාවක කාර්මික උද්‍යානය (ආහාර සැකසුම, ඇගළුම්, මැණික්, ස්වර්ණාභරණ, විද්‍යුත් නිෂ්පාදන, දැවමය ගෘහ භාණ්ඩ, රබර් ආශ්‍රිත නිෂ්පාදන)
- ♦ බටඅත
- ♦ මතුගම

## ප්‍රාදේශීය කර්මාන්ත ජනපද


| උදා:- | | | | |
|---|---|---|---|---|
| | ♦ හෝමාගම | ♦ පන්නල | ♦ අම්පාර | ♦ කුරුවිට |
| | ♦ මිනුවන්ගොඩ | ♦ උඩුකාව | ♦ කරන්දෙනිය | ♦ මාතලේ |
| | ♦ කළුතර | ♦ බෙලිඅත්ත | ♦ දංකොටුව | ♦ තමන්කඩුව |

මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්තශාලා මඟින් නිෂ්පාදනය ආරම්භ කර ඇත. ඒවා විදේශ වෙළෙඳපොළ සඳහා නිපදවයි.

## ඇගළුම් කර්මාන්ත 200 වැඩසටහන

කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවලින් පිටත දුර බැහැර පළාත්වල කර්මාන්ත ස්ථානගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ මොණරාගල, පුත්තලම, මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර, මහනුවර ආදී දිස්ත්‍රික්කවල කර්මාන්තශාලා ආරම්භ කරන ලදී. මේවායේ නිෂ්පාදනයන් විදේශයන් හි අලෙවි කිරීමෙන් ශ්‍රී ලංකාවේ විනිමය හිගය පියවා ගැනීමට උපකාරී වේ. නිදහස් වෙළෙඳ කලාපයේ ආයෝජකයින්ගේ කර්මාන්තශාලාවල ශාඛාවන් ද මෙම වැඩසටහන යටතේ පිහිටුවා තිබේ. (2010 කාර්මික නිමැවුමෙහි සංයුතිය අනුව රෙදිපිළි ඇගලුම් හා සම් නිෂ්පාදිතවල ප්‍රතිශතය 22%කි. (8.1 රූපය)

ශ්‍රී ලංකාවේ කර්මාන්ත දියුණු කිරීමේ අවශ්‍යතාව වර්තමානයේ වඩාත් ඉස්මතු වී ඇත. රට හේතු රාශියකි. ඒවායින් සමහරක් පහත දැක්වේ.




8.1 රූපය
ශ්‍රී ලංකාවේ කාර්මික නිමැවුමෙහි සංයුතිය

ක්‍රියාකාරකම 3

❖ ශ්‍රී ලංකා ආකෘති සිතියමක පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.
- ❒ කටුනායක, කොග්ගල, බියගම අපනයන සැකසුම් කලාප තුන
- ❒ සීතාවක, බටඅත, මතුගම කාර්මික උද්‍යාන
- ❒ මීරිගම, වතුපිටිවල, මිනුවන්ගොඩ, දංකොටුව, මාවතගම, කළුතර, බෙලිඅත්ත, පන්නල, අම්පාර යන කාර්මික ජනපද

❖ "රට සල්ලි උපයන අපේ ඇඟළුම් කර්මාන්තය" යන මාතෘකාව පිළිබඳ ව පහත සඳහන් තේමාවන් යටතේ පාසලේ බිත්ති පුවත් පතට ලිපියක් ලියන්න.
(තේමාවන්: ප්‍රධාන කලාප, ශ්‍රම දායකත්වය, අපනයන දිශාව, විදේශ විනිමය, ගැටලු)

❖ ඔබට ආසන්න ව ඇති කාර්මික කලාපයක් නැරඹීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන්න.

- ❒ රැකියා ප්‍රශ්නයට විසඳුමක් වීම.
- ❒ විදේශ විනිමය උපයා ගැනීමට හැකි වීම.
- ❒ ජීවන තත්වය උසස් කිරීමට දායක වීම හා රටේ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම.
- ❒ කෘෂිකාර්මික බෝග සමහරක් කාර්මික අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා නිසා කෘෂි අංශයේ වර්ධනයට දායක වීම.
- ❒ අමුද්‍රව්‍ය ලෙස අපනයනය කරන ඛනිජවලින් උපයා ගන්නා විදේශ විනිමයට වඩා ඒ ආශ්‍රිත කාර්මික නිෂ්පාදනවලින් ලබන විදේශ විනිමය වැඩි වීම.
- ❒ ප්‍රාදේශීය සම්පත් ආශ්‍රිත කර්මාන්ත ඇරඹීමෙන් යටිතල පහසුකම් වර්ධනය වී ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති වීම.
- ❒ දළ දේශීය නිෂ්පාදනයේ දායකත්වය ඉහළ නැංවීමට. 1977න් පසු මේ දක්වා කාර්මික අංශයෙන් ලැබූ දියුණුව නිසා ජාතික ආර්ථිකයට කර්මාන්ත අංශයේ දායකත්වය වැඩි වීම.

## ⏩ ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ ප්‍රවණතා

- ❒ කර්මාන්ත පෞද්ගලිකරණය වීම.
- ❒ විදේශීය ආයෝජන වැඩියෙන් යෙදීම.
- ❒ නව තාක්ෂණික දැනුම භාවිතය වැඩි වීම.
- ❒ නගරයෙන් දුරබැහැර ප්‍රදේශවල කර්මාන්ත ඇරඹීම.
- ❒ එකලස් කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම. උදා:- මයික්‍රෝ මෝටර් රථ
- ❒ ඇඟළුම් කර්මාන්ත අංශය සංවර්ධනය වීම.
- ❒ අපනයනයට මුල්තැන ලැබීම.
- ❒ කර්මාන්ත ආශ්‍රිත පරිසර දූෂණ කළමනාකරණය.
- ❒ දේශීය අමුද්‍රව්‍ය භාවිත කිරීම.

සේවා කර්මාන්ත

මිනිසාගේ සංකීර්ණ වූත් විවිධ වූත් අවශ්‍යතා යම් ආයතනයක් හෝ පුද්ගලයෙකු මගින් ඉටු කරනු ලබන්නේ නම් එය

### ශ්‍රී ලංකාවේ කර්මාන්ත ආශ්‍රිත ගැටලු

❖ ප්‍රාග්ධන හිඟය.
❖ පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය.
❖ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.
❖ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
❖ තාක්ෂණික දැනුම අඩුකම.
❖ බලශක්ති ගැටලුව.
❖ පරිසර දූෂණය.
❖ ඉන්දියාව, බංග්ලාදේශය, වියට්නාමය, කාම්බෝජය වැනි රටවල් අඩු පිරිවැයක් යටතේ නිපදවන භාණ්ඩවලින් එල්ල වන තරගය

### ශ්‍රී ලංකාවේ කර්මාන්ත ආශ්‍රිත ගැටලු සඳහා පිළියම්

❖ විදේශ ආධාර ලබා ගැනීම.
❖ විදේශ වෙළෙඳපොළ පුළුල් කර ගැනීම.
❖ විදේශ ආයෝජකයන්ට යටිතල පහසුකම් ලබා දීම (ණය බදු විරාම ආදී).
❖ නව තාක්ෂණය කර්මාන්ත සඳහා යොදා ගැනීමෙන් නිෂ්පාදනය වේගවත් කිරීම.
❖ ජාත්‍යන්තර වෙළෙඳපොළ ස්ථාවර ව තබා ගැනීමට කටයුතු කිරීම.
❖ ආකර්ෂණීය මෝස්තර අනුව නිෂ්පාදන විවිධාංගිකරණය කිරීම.
❖ නිෂ්පාදන කලට වේලාවට වෙළෙඳපොළට සැපයීම.
❖ පිරිවැය අඩු කර ගැනීමට ක්‍රමෝපායක් අනුගමනය කිරීම.
❖ අපනයන භාණ්ඩවල ගුණාත්මකභාවය වැඩි කිරීම.
❖ ආසන්න රටවල් සමග ගිවිසුම් මගින් වෙළෙඳ ගනුදෙනු ඇති කර ගැනීම. උදා:- සප්තා


## කර්මාන්ත දිරිගැන්වීම සඳහා වර්තමානයේ රජය විසින් ගෙන ඇති පියවර

- ❑ ප්‍රාදේශීය කාර්මීකරණය වැඩි දියුණු කිරීම සඳහා "නිපයුම් ශ්‍රී ලංකා" , "ගමට කර්මාන්ත" , "නැගෙනහිර නවෝදය" වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❑ 2009 අයවැය මගින් දේශීය කර්මාන්ත දිරිගැන්වීම සඳහා ආනයනික කාර්මික භාණ්ඩ කිහිපයක් සඳහා බදු පැනවීම. නිදසුන් - කඩදාසි, ලේටෙක්ස් රබර්, සම්භාණ්ඩ, කිරිපිටි, සීනි
- ❑ කර්මාන්ත අංශයට අදාළ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අරමුණ ඇති ව "ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික උද්‍යානය" හෝමාගම පිහිටුවීමට මූලික පියවර ගැනීම.
- ❑ ත්‍රිකුණාමලය, පුත්තලම, හම්බන්තොට හා අම්පාර යන දිස්ත්‍රික්කවල නව ආයෝජන ප්‍රවර්ධන කලාප ආරම්භ කිරීමට කටයුතු කිරීම.

ක්‍රියාකාරකම 4

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත ආශ්‍රිත ගැටලු පහක් ලියන්න.
- ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ ප්‍රවණතා පහක් ලියන්න.
- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දියුණුව සඳහා තව දුරටත් රජයට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කරන්න.

වකි. එම සේවා රාජ්‍ය අනුග්‍රහය යටතේ නොමිලේ ලැබෙන සේවා මෙන් ම මුදල් ගෙවා ලබා ගත හැකි සේවාවන් වශයෙන් ද ඇත. සේවා කර්මාන්ත ක්ෂේත්‍රයට අයත් අංශ කිහිපයකි. (8.2 රූපය බලන්න). සේවා කර්මාන්ත සම්බන්ධ අවසාන නිමැවුම ද්‍රව්‍යමය එකක් නොවේ. එහෙත් සේවා අංශය රටක ආර්ථිකයේ සෑම අංශයක ම ක්‍රියාත්මක වන්නකි.




8.2 රූපය
සේවා කර්මාන්ත කිහිපයක්

8.4 වගුව
ශ්‍රී ලංකාවේ සේවා කර්මාන්ත

| සේවා ක්ෂේත්‍රය | මූලික ප්‍රභේද | සේවාවේ මූලික ස්වරූපය |
|---|---|---|
| **ප්‍රවාහනය** | රාජ්‍ය අංශය | |
| | ❑ මහා මාර්ග | මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ අධිවේගී මාර්ග ඉදිකර ඇත. මහා මාර්ග A, B, C, D, E වශයෙන් වර්ග කර ඇත. |
| | ❑ දුම්රිය මාර්ග | පුළුල් ඒකීය හා ද්විත්ව මාර්ග වශයෙන් වර්ග කර ඇත. |
| | ❑ ගුවන් ප්‍රවාහන | දේශීය/විදේශීය ගුවන් ප්‍රවාහනයට යොදා ගනී. |
| | ❑ ජල ප්‍රවාහන | නැව් හා බෝට්ටු මගින් භාණ්ඩ හා මගී ප්‍රවාහනය. |
| | පෞද්ගලික අංශය | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ බස් රථ ගමනාගමනය. |

| | | |
|---|---|---|
| සන්නිවේදනය | මුද්‍රිත | පුවත් පත්, සඟරා, පත්‍රිකා, පෝස්ටර් ආදිය |
| | ශ්‍රව්‍ය | දුරකතන, ගුවන්විදුලි සේවා, හඬ පටි (Tape) |
| | දෘශ්‍ය | ඊ-මේල්, ඊ-නෙට්, පරිගණක තොරතුරු ආදිය |
| | ශ්‍රව්‍ය දෘශ්‍ය | රූපවාහිනී සේවාවන්, අන්තර් ජාලය |
| තැපැල් සේවය | රාජ්‍ය අංශය | තැපැල් දෙපාර්තමේන්තුවේ ආයතන හා කටයුතු |
| | පෞද්ගලික අංශය | නියෝජිත තැපැල් කාර්යාල |
| රක්ෂණ, බැංකු, මූල්‍ය වෙළෙඳාම | රාජ්‍ය බැංකු සේවා | මහජන බැංකුව, ලංකා බැංකුව, මහ බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| | පෞද්ගලික බැංකු සේවා | හැටන් නැෂනල් බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව ආදී |
| | මූල්‍ය ආයතන | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ද ෆිනෑන්ස් සමාගම ආදී ආයතන |
| | රජයේ අනුබද්ධ රක්ෂණ ආයතන | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
| | පෞද්ගලික රක්ෂණ ආයතන | සෙලින්කෝ, සී. ටී. සී. ඊගල් ආදී |
| | රජයේ වෙළෙඳ කටයුතු | විවිධ සේවා සමුපකාර සමිතිය හා ස.තො.ස. |
| | පෞද්ගලික වෙළෙඳ කටයුතු | විවිධ සුපිරි වෙළෙඳසල් හා වෙනත් තොග හා සිල්ලර වෙළෙඳාම් ආයතන වර්ග |
| අධ්‍යාපන සේවය | රාජ්‍ය අංශය | ජාතික පාසල්, ඉසුරු පාසල් 1AB, 1C, 2, 3 වශයෙන් වර්ග කර ඇත. |
| | පෞද්ගලික අංශය | ජාත්‍යන්තර පාසල්, ආගමික පාසල් වර්ග |
| සෞඛ්‍ය සේවය | රජයේ රෝහල් | ජාතික රෝහල්, ශික්ෂණ රෝහල්, දිසා රෝහල්, ග්‍රාමීය රෝහල් වශයෙන් විවිධ වේ. |
| | පෞද්ගලික රෝහල් | නේවාසික වාට්ටු සහිත රෝහල් සහ විශේෂඥ වෛද්‍ය සේවාව |
| සංචාරක සේවා කර්මාන්තය | රාජ්‍ය අංශය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හා ශ්‍රී ලංකා හෝටල් පාසල, නිවාඩු නිකේතන |
| | පෞද්ගලික අංශය | තරු පහේ හෝටල්, සංචාරකයින් සඳහා විවිධ පහසුකම් සහ ආහාර සහිත සංචාරක නිකේතන, සංචාරක ප්‍රවාහන සේවා |

ක්‍රියාකාරකම 5

❖ ශ්‍රී ලංකාවේ සේවා කර්මාන්තවල ගැටලු හා මෑතකාලීන ප්‍රවණතා පහත සඳහන් මාතෘකා යටතේ ගොනු කර දක්වන්න. එක් ප්‍රභේදයකට ගැටලු සහ ප්‍රවණතා දෙක බැගින් ප්‍රමාණවත් ය.

| සේවාව | ගැටලු | ප්‍රවණතා |
|---|---|---|
| 1. ප්‍රවාහන සේවය | 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |
| 2. සන්නිවේදන සේවාව | 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |
| 3. බැංකු මූල්‍ය රක්ෂණ සේවා | 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |
| 4. වෙළෙඳාම | 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |
| 5. තැපැල් සේවය | 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |
| 6. අධ්‍යාපනය | 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |
| 7. සෞඛ්‍ය සේවාව | 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |
| 8. සංචාරක කර්මාන්තය | 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |